www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ග්‍රින්ස්පන් වෙනුවෙන්

## For Grynszpan

1939 පෙබරිවාරි 14වැනිදා සෝෂලිස්ට් ඇපීල් වෙතින් උපුටා ගෙන පල කෙරේ.

**ලියොන් ට්‍රොට්ස්කි විසිනි**
**2013 නොවැම්බර් 13**

ලෝසවෙඅ මෙහි පල කරන්නේ 1938 නොවැම්බර් 7වැනිදා 17ත් හැවිරිසි හර්ෂෙල් ග්‍රින්ස්පන් පැරීසියේ දී ජර්මානු තානාපති අර්නස්ට් ෆොම් රාත් වෙඩි තබා මරා දැමීමෙන් පසු, ලියොන් ට්‍රොට්ස්කි ලියූ ලිපියකි. එම ක්‍රියාව, ජර්මානු යුදෙව් ජනතාවට එරෙහිව ගෙන ගිය ක්‍රිස්ටල් නාක්ට් සංහාරයේ කඩතුරාව ලෙස, ජර්මානුවන් විසින් යොදාගනු ලැබිනි.

පෝලන්ත යුදෙව් යුවලකගේ පුතෙකු වූ ග්‍රින්ස්පන් ඉපදුනේ හා වැඩුනේ ජර්මනියේ ය. අවරුදු 14දී ඔහු ප්‍රන්සයට සංක්‍රමනය විය. ඔහු මෙම ඝාතනය සිදු කලේ ජර්මනිය තුල ජීවත් වූ තවත් යුදෙව් ජාතිකයන් දසදහස් ගනනක් සමග ඔහුගේ දෙමව්පියන් ද අමානුෂික තත්වයන් යටතේ බලහත්කාරයෙන් පෝලන්තයට පිටුවහල් කරන ලදැ යි දැනගැනීමෙන් පසු ය. ප්‍රන්සයේ විකී තන්ත්‍රය විසින් ජර්මනියට බාර දෙන ලදුව, බොහෝවිට සිදුවන්නට ඇත්තේ, 1942දී සැෂ්සෙන් හවුසෙන් කඳවුරේ දී ග්‍රින්ස්පන් ඝාතනය කිරීම යි.

1939 පෙබරවාරියේ දී මේ පිලිබඳව ලිවූ ලියොන් ට්‍රොට්ස්කි, නාසීන්ගේ හෝ නාසි-ට්‍රොට්ස්කි කුමන්ත්‍රනයක ඒජන්තයෙකු ලෙස චෝදනා කරමින්, ග්‍රින්ස්පන්ට පහර දුන් ස්ටැලින්වාදීන්ගේ මඩගැසීම්වලින්, ග්‍රින්ස්පන් ආරක්ෂා කලේ ය. මෙම ලිපිය 1939 පෙබරවාරි 14වැනිදා සෝෂලිස්ට් ඇපීල් යන ඇමරිකානු ට්‍රොට්ස්කිවාදීන්ගේ පුවත්පතෙහි ඉංග්‍රීසි බසින් ද මැයි මාසයේ දී පිටුවහලේ සිට වැඩ කල ජර්මන් ට්‍රොට්ස්කිවාදීන්ගේ උන්සර වාට් (අපේ ලෝකය) පුවත්පතෙහි ජර්මන් බසින් ද පලවුනි.

ෆැසිස්ට් මැරයන්ගේ ප්‍රතිපත්තිය ඍජුව හා ඇතැම් විට හිතාමතා ම ත්‍රස්තවාදී ක්‍රියාවන්ට උඩගෙඩි දුන් බව, දේශපාලන ඉතිහාසය පිලිබඳව මඳක් හෝ දන්නා ඕනෑ ම අයෙකුට පැහැදිලිය. මවිතයට කාරනය නම් මේ තාක් දුරට හමුවී ඇත්තේ එක ම එක ග්‍රින්ස්පන් කෙනෙකු වීම යි. එවැනි ක්‍රියාවන්ගේ සංඛ්‍යාව නිසැකවම ඉහල යනු ඇත.

කම්කරු පන්තියේ මෙන් ම පීඩිත ජාතීන්ගේ විමුක්ති අරගලයේ දී පුද්ගලික ත්‍රස්තවාදී උපක්‍රමය අයෝග්‍ය බව මාක්ස්වාදීන් වන අපි සලකමු. තනි හුදකලා වීරයෙකුට මහජනතාවගේ තැන ගත නොහැක. අපේක්ෂා භංගත්වයේ හා පලිගැනීමේ එවැනි ප්‍රකම්පිත ක්‍රියාවන්ගේ අනිවාර්යතාව පමනක් අපි ඉතා පැහැදිලිව වටහාගනිමු. ඔවුන්ට නිවරැදි මාර්ගය සොයා ගැනීමට නොහැකිව සිටියත්, අපගේ සියලු ආවේගයන් හා අපගේ සියලු සහානුකම්පාවන්, ජීවිත පරිත්‍යාගයෙන් පලිගැනීමට යොමුවූ අය සමග බෙදා හදා ගනු ඇත. අපගේ සහානුකම්පාව තීව්‍රවන්නේ ග්‍රින්ස්පන් දේශපාලන සටන්කාමියෙකු නො ව අත්දැකීම් විරහිත තරුනයෙකු, මුලුමනින් ම වගේ ලමයෙකු වන නිසා ය. ඔහුගේ එකම උපදේශකයා වූයේ යුක්තිසහගත කෝපයෙහි වේදනාව යි. තවදුරටත් ධනේශ්වර රාජ්‍යතාන්ත්‍රිකයේ අවශ්‍යතා ඉටුකර ලීම සඳහා ඔහුගේ හිස ගසා දැමීමට සමත් ධනේශ්වර අධිකරනයේ හස්තයෙන් ග්‍රින්ස්පන් ගලවා ගැනීම, ජාත්‍යන්තර කම්කරු පන්තියේ මූලික හා ක්ෂනික කර්තව්‍යය වන්නේය!

පොලිස් මෝඩකම් හා විස්තර කල නො හැකි ප්‍රචන්ඩත්වය තුල වඩාත් ජුගුප්සාජනක වන්නේ, ක්‍රෙම්ලිනයේ අනින් ජාත්‍යන්තර ස්ටැලින්වාදී මාධ්‍යය, ග්‍රින්ස්පන්ට එරෙහිව දැන් ගෙනයමින් තිබෙන උද්ඝෝෂනය යි. ඔවුන් උත්සාහ කරන්නේ ඔහු නාසීන්ගේ ඒජන්තයෙකු නැතහොත් නාසීන් සමග සම්බන්ධ ට්‍රොට්ස්කිවාදීන්ගේ ඒජන්තයෙකු ලෙස පෙන්වාදීමට ය. ප්‍රකෝපකාරියා හා ඔහුගේ ගොදුර එක ගොඩකට ඇද දමමින් ස්ටැලින්වාදීහු, හිට්ලර්ගේ සංහාරක පියවරයන්ට වාසිදායක කඩතුරාවක් නිර්මානය කිරීමේ අභිප්‍රාය ග්‍රින්ස්පන්ට ආරෝපනය කරති. විලිලැජ්ජාවේ අංශුවක්වත් ඉතිරිව නැති දූෂිත "මාධ්‍යවේදීන්" ගැන කිව හැක්කේ කුමක් ද? සමාජවාදී ව්‍යාපාරයේ ආරම්භයේ සිට ම ධනේශ්වරය හැමවිට ම යුක්ති සහගත කෝපය පල කරන ප්‍රචන්ඩතා, විශේෂයෙන්ම ත්‍රස්තවාදී ක්‍රියා, මාක්ස්වාදයේ පිරිහෙමින් ඇති අනුභස වෙත ආරෝපනය කලේ ය. මෙහිදී මෙන්ම වෙනත් තැන්වලදී ද ස්ටැලින්වාදීන් උරුම කර ගෙන ඇත්තේ ප්‍රතිගාමිත්වයේ නින්දිත ම සම්ප්‍රදාය යි. ස්ටැලින්වාදීන් ද ඇතුලු ප්‍රතිගාමී කුනුකන්දල්

දැන් ඉබේ ම වාගේ, සෑම නිර්භීත ක්‍රියාවක් හා විරෝධතාවක්, සෑම ප්‍රකුපිත පිපිරීමක් හා අලුගෝසුවන් වෙත එල්ල කරන සෑම ප්‍රහාරයක් ම, හතරවැනි ජාත්‍යන්තරය සමග සම්බන්ධ කිරීම පිලිබඳව හතරවැනි ජාත්‍යන්තරයට යුක්තිසහගත ලෙස ආඩම්බර විය හැක.

එවකට මාක්ස්ගේ ජාත්‍යන්තරය සම්බන්ධයෙනුත් එය එයාකාරයෙන්ම සිදු විය. ස්වභාවයෙන්ම අප, විවෘත, යහපත් සහයෝගිත්වයේ බන්ධනයෙන් බැඳෙන්නේ, ග්‍රීන්ස්පන් සමග මිස, ඔහුගේ "ප්‍රජාතන්ත්‍රවාදී" බන්ධනාගාර පාලකයන් හෝ ස්ටැලින්වාදී මඩගසන්නන් සමග නො වේ. අර්ධ වශයෙන් හෝ වක්‍රොත්තියෙන් නමුත් ඔවුන්ට ග්‍රීන්ස්පන්ගේ මලකඳ අවශ්‍ය වන්නේ, මොස්කව් අධිකරන තීන්දු ඔසවා තැබීමට ය. ඇටමිදුලවලට ම පරිහානියට පත්ව ඇති ක්‍රෙම්ලිනයේ රාජ්‍යතාන්ත්‍රිකය ඒ අතරවාරයේම, මෙම "ප්‍රීතිමත්" සිදුවීම උපයෝගීකර ගැනීමට උත්සාහ කරන්නේ, අන්‍යොන්‍ය වශයෙන් ත්‍රස්තවාදීන් ආපසු අදාල රටවලට බාර දීම සඳහා හිට්ලර්ගේ හා මුසෝලිනිගේ ආන්ඩු ද ඇතුලු නොයෙකුත් ආන්ඩු අතර ජාත්‍යන්තර ගිවිසුමක් සඳහා ඔවුන්ගේ යාන්ත්‍රනය අලුත් කර ගැනීමට ය. ප්‍රෝඩාවේ දෙටුවනි, ප්‍රෙව්සම් වනු! අඩු වශයෙන් විදේශ රටවල් දුසිමකවත් එවැනි නීතියක් ක්‍රියාවට නැගීම, ස්ටැලින්ගේ ක්ෂනික ගැලවීම සඳහා අවශ්‍ය වනු ඇත.

ග්‍රීන්ස්පන් "ට්‍රොට්ස්කිවාදීන්ගේ රැස්වීම්වලට" සහභාගී වූ බව, ස්ටැලින්වාදීහු පොලිසියේ කන්වලට බෙරිහන්දී කියා සිටියහ. අවාසනාවකට මෙන් එය සත්‍ය නො වේ. හතරවැනි ජාත්‍යන්තරයේ පරිස්ථිතියට පැමින තිබුනා නම්, ඔහුගේ විප්ලවවාදී ශක්තිය සඳහා වඩා වෙනස් හා ඵලදායි බිහිදොරක් ඔහුට සොයා ගැනීමට ඉඩ තිබුනි. අසාධාරනයට හා කුරිරුකමට එරෙහිව සෝෂාකිරීමට පමනක් හැකි පුද්ගලයෝ සුලභ වෙති. එහෙත් තේරුම් ගැනීමට මෙන් ම ක්‍රියාත්මකවීමට ද හැකි, අවශ්‍ය නම් තමන්ගේ ජීවිත වුවත් කැප කරන ග්‍රීන්ස්පන් වැනි අය, මනුෂ්‍ය වර්ගයාගේ අනර්ඝ සම්මිශ්‍රන වෙති.

ඔහුගේ ක්‍රියා පිලිවෙල සඳහා නොවුනත්, සදාචාරාත්මක අර්ථයෙන් ග්‍රීන්ස්පන්, සෑම තරුන විප්ලවවාදියෙකුටම උදාහරනයක් ලෙස පවතිනු ඇත. ග්‍රීන්ස්පන් සමග අපගේ විවෘත සදාචාරාත්මක සහයෝගිත්වය, ග්‍රීන්ස්පන් කෙනෙකු විය හැකි සියල්ලන්ට ම, ඒකාධිපතිවාදය හා කෲරත්වයට එරෙහිව සටනේ දී ජීවිත පරිත්‍යාගයට සමත් සියල්ලන්ටම, වෙනත් මාවතක් සොයනු! යි පැවසීමට අපට අතිරේක අයිතියක් ලබා දෙයි.

පීඩිත ජනතාව නිදහස් කල හැකි වන්නේ, හුදකලා පලිගන්නෙකුට නො ව, මහා විප්ලවවාදී මහජන ව්‍යාපාරයකට පමන ය. මෙම ව්‍යාපාරය පන්ති සූරාකෑම, ජාතික මර්දනය හා වර්ගවාදී වධබන්ධනවල සමස්ත ව්‍යුහයේ කැබැල්ලක් වත් ඉතුරු නොකරනු ඇත. ෆැසිස්ට්වාදයේ පෙර නො වූ විරූ අපරාධ, මුලුමනින් ම යුක්තිසහගතවූ පලිගැනීම සඳහා උත්සුකතාව නිර්මානය කර යි. එහෙත් ඔවුන් සිදුකරන අපරාධයන්ගේ පරිමාව කෙතරම් ගොරතර වුවත්, හුදකලා ෆැසිස්ට් නිලධරයන් ඝාතනය කිරීමෙන් මෙම උත්සුකතාව සපුරාගත නො හැක. ඒ සඳහා ලෝකය පුරා, මිලියන ගනන්, මිලියන සිය ගනන්, පීඩිත ජනතාව පන ගැන්විය යුතු අතර පැරනි සමාජයේ බලකඳවුරු වලට ප්‍රහාර එල්ල කිරීම සඳහා ඔවුන් මෙහෙය විය යුතු ය. මහජනතාවගේ යුක්ති සහගත කෝපයට සැබෑ තෘප්තියක් සපයා දිය හැක්කේ, වහල් භාවයේ සියලු ම රූපාකාරයන් පෙරලා දැමීමෙන්, ෆැසිස්ට්වාදය මුලුමනින්ම වනසා දැමීමෙන් හා සමකාලීන පල්හොරුන් හා මැරයන් පිලිබඳ නිර්දය විනිශ්චයක් ගන්නා මිනිසුන්ට පමනකි.

නිශ්චිතව ම හතරවැනි ජාත්‍යන්තරය පවරාගෙන ඇති කර්තව්‍ය මෙය යි. එය ස්ටැලින්වාදී වසංගතයෙන් කම්කරු ව්‍යාපාරය පවිත්‍ර කරනු ඇත. එය තම සාමාජිකත්වය තුල තරුනයන්ගේ වීරෝදාර පරම්පරාවක් ඒකරාශී කරනු ඇත. එය පලදායී හා වඩාත් මානවවාදී අනාගතයකට මාවතක් සකසනු ඇත.

© www.wsws.org